10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 22 පාඩම

සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 22 පාඩම

# රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

# යහපත් රජ්‍ය පාලනයක් සඳහා මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම්

1. දස සක්විතිවත්
2. සප්ත අපරිහානීය ධර්ම
3. සතර සංග්‍රහ වස්තු
4. සතර අගතියෙන් තොරවීම

# යහපත් රජ්‍ය පාලනයක් සඳහා මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම්

## 1.දස සක්විතිවත්

- දස සක්විතිවත් නමින් හැඳින්වෙන මෙම රාජ්‍ය පාලන පිළිවෙත් දහය දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ දැක්වේ.

# 1.දස සක්විතිවත්

01. අඹුදරුවන් ඇතුළු රජ පවුලේ පිරිසට ධාර්මික රැකවරණය සැලසීම.

02. රට රකින බල සෙනඟට ධාර්මික රැකවරණය සැලසීම.

03. රාජ්‍ය සේවයේ නියුතු විවිධ තනතුරු දරන ක්ෂත්‍රිය පිරිසට ධාර්මික රැකවරණය සැලසීම.

04. කෘෂි කර්මාන්තය ආදී නිෂ්පාදන කටයුතුවල නිරත බ්‍රාහ්මණ ගෘහපතීන්ට ධාර්මික රැකවරණය සැලසීම.

# 1.දස සක්විතිවත්

05. කුඩා ගම්වල වැසියනට හා ජනපදවාසීන්ට ධාර්මික රැකවරණය සැලසීම.

06. ජනතාවගේ සදාචාර සංවර්ධනයට මඟ පෙන්වන ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිස්වලට ධාර්මික රැකවරණය සැලසීම.

07. තිරිසනුන්ට හා පක්ෂීන්ට ධාර්මික රැකවරණය සැලසීම.

# 1.දස සක්විතිවත්

08. රටේ අධාර්මික ක්‍රියා ඇති නොවන අයුරින් කටයුතු කිරීම.

09. දිළිඳු ජනයාට ධනය දීම.

10. සිල්වත්, ගුණවත්, වියත් මහණ බමුණන්ගේ අවවාද අනුශාසනා ලබා ගනිමින් රට පාලනය කිරීම.

# දස සක්විතිවත්වල අන්තර්ගත බෞද්ධ රාජ්‍ය පාලනයකින් අපේක්ෂා කරන වැදගත් කරුණු

1. ධාර්මික රාජ්‍ය පාලනය.
2. මිනිස් තිරිසන් ආදී සෑම කොටසකට ම ආරක්ෂාව ලබා දීම.
3. නීතිය ක්‍රියාත්මක කරමින් නීති විරෝධී අධාර්මික ක්‍රියා වැළැක්වීම.
4. සුදුසු පුද්ගලයන්ගෙන් උපදෙස් ලබා ගැනීම.

# යහපත් රජය පාලනයක් සඳහා මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම්

## 02. සප්ත අපරිහානීය ධර්ම

- බුද්ධ කාලීන භාරතයේ රාජාණ්ඩු හා සමූහාණ්ඩු හෙවත් ගණතන්ත්‍ර යනුවෙන් පාලන ක්‍රම 2ක් පැවතුනි.
- වජ්ජි රජදරුවන් ඒ අතරින් ගණතන්ත්‍ර පාලනයක් ක්‍රියාත්මක කළ බව සඳහන් වේ.
- ඔවුන්ගේ අභිවෘද්ධිය ඇති කළ, පිරිහීම වැළැක්වූ එම පාලන ක්‍රමය ප්‍රතිපත්ති හතකින් යුක්ත වූ අතර ඔවුන් ඒවා ඉගෙන ගත්තේ බුදුරදුන්ගෙනි.

# සප්ත අපරිහානීය ධර්ම

1. නිතර නිතර රැස්වීම.
2. සමගි ව රැස් වී, සමගිව සාකච්ඡා කොට, සමගි ව විසිර යාම.
3. පෙර නොපැන වූ නීති, නොපැනවීම හා පනවන ලද නීති කඩ නොකොට ආරක්ෂා කිරීම.
4. වැඩිහිටියන්ට හා ඔවුන්ගේ අදහස්වලට ගරු කිරීම.
5. කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම.
6. වජ්ජී රාජ්‍යය ඇතුළත හා පිටත පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා කඩ නොකොට පුද සිරිත් පැවැත්විම.
7. තම රාජ්‍යයට පැමිණීම හා පැමිණෙන පූජනීය උතුමන්ට පහසුකම් සැලසීම.

# දස සක්විතිවත්වල අවධාරණය නොවන, සප්ත අපරිහානීය ධර්මවල ඉගැන්වෙන වැදගත් පාලන ප්‍රතිපත්ති

01. රාජ්‍ය පාලකයින් සමගිව ක්‍රියා කිරීම.

02. නීතිය නිසි ලෙස ආරක්ෂා කිරීම.

03. කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම.

04. පූජනීය ස්ථාන ආරක්ෂා කරමින් එම උතුමන්ට පහසුකම් සැලසීම.

# යහපත් රජ්‍ය පාලනයක් සඳහා මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම්

## 03. සතර සංග්‍රහ වස්තු

- සමාජයක සෑම පුද්ගලයෙකු විසින් ම අනුගමනය කළ යුතු පිළිවෙත් හතරකි.
- මෙම පිළිවෙත් විශේෂයෙන් ම නායකත්වය දරන්නෙකු තුළ තිබිය යුතුය.

# 03. සතර සංග්‍රහ වස්තු

01. දානය.

02. ප්‍රිය වචනය.

03. අර්ථ චර්යාව.

04. සමානාත්මතාව.

# සතර සංග්‍රහ වස්තු

## 01. දානය

- දානය යනු හුදෙක් ආගමික කටයුත්තක් පමණක් නොව පාලකයා විසින් රටේ ජනතාවගේ ආර්ථික අභිවෘද්ධිය උදාකරලීමේ අරමුණින් ප්‍රාග්ධනය සැපයීම යි.
- ගොවිතැන් කරන පිරිසට අදාළ භූමිය, බිත්තර වී, පොහොර, ජලය ලබා දීම.
- වෙළෙඳාමේ යෙදෙන අයට වෙළෙඳපොළ හා ප්‍රාග්ධනය ලබා දීමත්, රාජ්‍ය සේවයේ හෝ වෙනත් සේවාවන් සපයන පිරිස් සඳහා නිසි ලෙස බත් වැටුප් ලබා දීම.

මෙසේ රජු ක්‍රියා කිරීමෙන් ජනතාව ද වගවීමෙන් යුතුව ක්‍රියා කරමින් සොරකමින්, වංචාවෙන්, දූෂණයෙන්, ප්‍රාණඝාතයෙන් තොරව කටයුතු කිරීමට පෙළඹෙයි.

# සතර සංග්‍රහ වස්තු

## 02. ප්‍රිය වචනය

- ප්‍රිය වචන යනු යහපත් වචන යි.
- එනම් වචනයෙන් සිදු වන වැරදි හතරෙන් තොර ව කතාබස් කිරීම යි. (බොරුව, කේළම, හිස් වචන, රළු වචනයෙන් වැළකීම)
- පාලකයා ද ප්‍රජාවට සත්‍ය ප්‍රකාශ කිරීමත්, ඔවුන් භේද කිරීමෙන් වැළකී සමගිය දියුණු කිරීමත්, අර්ථවත් දේ කතා කිරීමත්, කනට මිහිරි ප්‍රියශීලී කතාබස් ඇති බවත් යහපත් පාලනයක් සඳහා අවශ්‍ය වේ.

# සතර සංග්‍රහ වස්තු

## 03. අර්ථ චර්යාව

- අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීමයි.
- සැබෑ පාලකයාට ජනතා සේවය හැර වෙනත් අරමුණක් තිබිය නොහැකි අතර එය ඔහුගේ පරම යුතුකම වේ.
- මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා වන සිව් බඹවිහරණ නම් වූ ගුණ ධර්ම වලින් හදවත පුරවාගත් පාලකයෙකුට ජවතාවට අර්ථවත් සේවාවක් කිරීමට පහසුය.
- රට වැසියන් තම දරුවන් ලෙස සිතා කටයුතු කිරීමෙන් පිය පුතු සබඳතාවෙන් යුතුව ජනතාවට සේවය කළ හැකිය.

# සතර සංග්‍රහ වස්තු

## 04. සමානාත්මතාව

- රටක ජනතාව විවිධ කුල, ජාති, ආගම්, භාෂා අනුව වර්ග වී සිටිය ද ඒ සඅයල් දෙනා කෙරෙහි සම සිතින් කටයුතු කිරීම සමානාත්මතාව යි.
- මේ ගුණාංගය නිසා රට වැසියාගේ අයිතිවාසිකම් හා නිදහස සමාන අයුරින් සුරක්ෂිත වේ.
- ශිෂ්‍ය නායක, පන්ති නායක, නිවාස නායක, ක්‍රීඩා කණ්ඩායම් නායක ආදී තනතුරු ලැබුන විට ද මෙම සමානාත්මතා ගුණයෙන් ක්‍රියා කළ යුතුය.

# යහපත් රජය පාලනයක් සඳහා මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම්

## 04. සතර අගතියෙන් තොර වීම

- අගතිය යනු නීතියට, යුක්තියට, ධර්මයට පටහැනිව (විරුද්ධව) ක්‍රියා කිරීම යි.
- එසේ කිරීමට පාලකයා පොළඹවන කරුණු හතරකි.

1. ඡන්ද
2. ද්වේෂය
3. භය
4. මෝහය

යුක්තිය හා සාධාරණත්වය ඉටුවන ලෙස ක්‍රියා කිරීමෙන් අගතිගාමීත්වය වැළකේ.

# සතර අගතියෙන් තොර වීම

## 01. ඡන්දය

- ඡන්දය යනු කැමැත්ත යි.
- අගතිගාමී වීම යනු තමන්ගේකම, නෑදෑකම, හිතවත්කම, පාක්ෂිකත්වය ආදි පෞද්ගලික රුචි අරුචිකම් සලකා අයුතු වැඩ කිරීම යි.

# සතර අගතියෙන් තොර වීම

## 02. ද්වේෂය

- ද්වේෂය යනු විරුද්ධවාදී සිතුවිල්ලකි.
- තමන්ගේ නොවන, තමන්ට විරුද්ධ, තම පක්ෂයේ නොවන අයට අසාධාරණකම් කිරීමයි.
- ද්වේශයෙන් අගතියට ගිය පාලකයෙකුට යුක්තිය හෝ අයුක්තිය, සුදුසුකම් හෝ නුසුදුසුකම්, සාරධර්ම හෝ අසාර ධර්ම නොපෙනේ.
- ද්වේෂය සහිත පාලකයෙකුට මධ්‍යස්ථ හෝ නිවැරදි තීරණ ගතනොහැකිය.

# සතර අගතියෙන් තොර වීම

## 03. භය

- කිසියම් පුද්ගලයෙකුට හෝ සංවිධානයකට ඇති බිය නිසා ජනතාවට අහිතකර වැරදි තීරණ වලට එළඹීම යි.
- එසේ ක්‍රියා කිරීම රට වැසියාට නිසැකවම හානිදායකය.

# සතර අගතියෙන් තොර වීම

## 03. මෝහය

- මෝහය යනු මුලාවයි.
- සමාජය තුළ නීතිය, සාමය නිසි ලෙස ක්‍රියාවට නැංවීමට මෝහය ඇති පාලකයෙකුට නොහැකිය.
- යුක්තිය හා අයකුතිය හොඳ නරක තොරා බේරා ගැනීමට පාලකයාට තික්ෂණ බුද්ධියක් තිබිය යුතුය.

# තෙරුවන් සරණයි..!